# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2349/42 - 2023 සැප්තැම්බර් මස 16 වැනි සෙනසුරාදා - 2023.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී.277/40(iv)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

16 වන වගන්තිය යටතේ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 16 වන වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මම, මේ නියමය මඟින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා "පැරණි ස්මාරක" වශයෙන් සලකනු ලැබිය යුතු බව ප්‍රකාශයට පත් කරමි.

**විදුර වික්‍රමනායක,**
බුද්ධශාසන, ආගමික හා
සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

**පැරණි ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ස්මාරක**

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට අංක 155 ග්‍රාම නිලධාරි වසමට අයත් කුරුවිට නගර මධ්‍යයේ පිහිටි පැරණි දුම්රිය පාලන ගොඩනැගිල්ල සහ පැරණි දුම්රිය නිවාස ගොඩනැගිල්ල (උතුරු අක්ෂාංශ 6° 65′ 15″ N හා නැගෙනහිර දේශාංශ 80° 22′ 015″ E).

2. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇල්ලගල ග්‍රාම නිලධාරි වසමට අයත් අංජලීගල පුරාවිද්‍යා ස්ථානයේ ඇති නටබුන් ගොඩනැගිල්ල, ශිලාලේඛණ තුන සහ අනෙකුත් පෞරාණික ඉදිකිරීම්වල නටබුන් ද පැරණි ස්තූපය සහ ඒ වටා මීටර් 100 ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 32′ 290″ N හා නැගෙනහිර දේශාංශ 81° 24′ 252″ E).

1A - G 40326 — 07 (2023/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරින්ද අංක 19 ග්‍රාම නිලධාරි වසමට අයත් කිරින්ද දළදා විහාර භූමියේ ඇති නටබුන් ගොඩනැගිල්ල, පැරණි ස්තූපය සහ එහි සිට මීටර් 100 ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 22´ 077″ N හා නැගෙනහිර දේශාංශ 81° 33´ 133″ E).

4. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශුද්ධ නගරය අංක 8 ග්‍රාම නිලධාරි වසමට අයත් තිස්සමහාරාමය ශිලාපස්ස පිරිවෙන් විහාර භූමියේ ඇති ශිලාපස්ස පිරිවෙන් ගොඩනැගිල්ල සහ ඊට වෙන්කර ඇති භූමි පරිශ්‍රය ද (උතුරු අක්ෂාංශ 6° 27´ 64″ N හා නැගෙනහිර දේශාංශ 81° 29´ 05″ E) එම පිරිවෙනට අයත් තිස්සමහා විද්‍යාල භූමියේ ඇති පැරණි නටබුන් ගොඩනැගිල්ල සහ ඒ වටා මීටර් 50 ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 27´ 644″ N හා නැගෙනහිර දේශාංශ 81° 29´ 090″ E).

5. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙවිනුවර දකුණ ග්‍රාම නිලධාරි වසමට අයත් දෙවිනුවර ග්‍රාමයේ ප්‍රදීපාගාර වීදියේ ඇති දෙවිනුවර තුඩුව ආසන්නයේ පිහිටි ප්‍රදීපාගාරය (උතුරු අක්ෂාංශ 5° 55´ 275″ N හා නැගෙනහිර දේශාංශ 80° 35´ 645″ E).

6. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරව්ව 30D ග්‍රාම නිලධාරි වසමට අයත් කරව්ව ග්‍රාමයේ පිහිටි කරව්ව අම්බලම හා එයට අයත් පර්චස් 0.28 ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 20´ 52.54″ N හා නැගෙනහිර දේශාංශ 80° 14´ 10.09″ E).

7. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩේවීදිය දකුණ අංක 417 B ග්‍රාම නිලධාරි වසමට අයත් මාතර පොලිස් ස්ථානය පවත්වාගෙන යනු ලබන පැරණි ගොඩනැගිල්ල සහ පැරණි අශ්ව ඉස්තාල ගොඩනැගිල්ල.

8. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කුඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹුරුපිටිය ග්‍රාම නිලධාරි වසමට අයත් කුඹුරුපිටිය ග්‍රාමයේ ඇති කුඹුරුපිටිය මංසන්ධියේ උතුරින් විදුහල් මාවතට ද; නැගෙනහිරින් පෞද්ගලික ඉඩම්වලට ද; දකුණින් අතුරු මාර්ගයට ද; බටහිරින් කුඹුරුපිටිය-දෙයියන්දර මාර්ගයට ද මායිම් වූ භූමි පරිශ්‍රය හා ඒ තුළ පිහිටි පැරණි අම්බලම (උතුරු අක්ෂාංශ 6° 48´ 13″ N හා නැගෙනහිර දේශාංශ 80° 33´ 98.3″ E).

9. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇහැටුවාගම අංක 326 ග්‍රාම නිලධාරි වසමට අයත් රඹෑවැව ග්‍රාමයේ ඇති ඇත්පන්තිය වැවට වයඹ දෙසින් පිහිටි ටැම්පිට ගොඩනැගිල්ල (උතුරු අක්ෂාංශ 8° 32´ 0313″ N හා නැගෙනහිර දේශාංශ 80° 18´ 9935″ E) සහ ඒ වටා මීටර් 20 ක භූමි පරිශ්‍රය.

10. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇහැටුවාගම අංක 326 ග්‍රාම නිලධාරි වසමට අයත් රඹෑවැව ග්‍රාමයේ පිහිටි කෝන්ගස්දිගිලිය වැව් බැම්මට මීටර් 50 ක් පමණ නැගෙනහිර දෙසින් පිහිටි ටැම්පිට ගොඩනැගිල්ල හා දැගැබ් ගොඩැල්ල සහිත ස්මාරක වටා මීටර් 20 ක භූමි පරිශ්‍රය.

11. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇහැටුවාගම අංක 326 ග්‍රාම නිලධාරි වසමට අයත් රඹෑවැව ග්‍රාමයේ පිහිටි කුඩාවැව වැව් රක්ෂිතයට නැගෙනහිර දෙසින් පිහිටි ටැම්පිට ගොඩනැගිල්ල (උතුරු අක්ෂාංශ 8° 33´ 0288″ N හා නැගෙනහිර දේශාංශ 80° 12´ 8972″ E) සහ ඒ වටා මීටර් 20 ක භූමි පරිශ්‍රය.

12. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රළපනාවගම අංක 338 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රළපනාවගම ග්‍රාමයට අයත් දිවුල්ගහවැව හේන්යාය නමින් හඳුන්වන ඉඩමේ ඇති ගල්පඩි සහිත ගල්වැටිය (උතුරු අක්ෂාංශ 8° 30´ 0436″ N හා නැගෙනහිර දේශාංශ 80° 23´ 375″ E).

13. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුස්නව අංක 473 ග්‍රාම නිලධාරි වසමට අයත් හැළඹෑව ග්‍රාමයේ පිහිටි ආච්චිගම මෙගලිතික් සුසාන සහිත භූමිය (උතුරු අක්ෂාංශ 8° 01´ 208″ N හා නැගෙනහිර දේශාංශ 80° 46´ 675″ E),

14. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේකිත්ත අංක 169 ග්‍රාම නිලධාරි වසමට අයත් හේකිත්ත ග්‍රාමයේ පිහිටි හැඳල ලාදුරු රෝහල් භූමියේ ඇති පැරණි ගොඩනැගිලි හත සහ එම එක් එක් ගොඩනැගිලි වටා අඩි 15 ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 58´ 55.9″ N හා නැගෙනහිර දේශාංශ 79° 52´ 33.8″ E).

15. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පමුණුවිල අංක 265 ග්‍රාම නිලධාරි වසමට අයත් පමුණුවිල ග්‍රාමයේ ගල්පොත්ත දෙනිමුල්ල මාවතේ පිහිටි ගල් ඒදණ්ඩ සඳහා භාවිත කරන ලද ගල් කණු පහ සහ ඒ වටා සිව් දෙසට මීටර් 5 ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 57´ 54.8″ N හා නැගෙනහිර දේශාංශ 79° 56´ 17.8″ E).

16. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 489 පෝරේ ග්‍රාම නිලධාරි වසමට අයත් පෝරේ ග්‍රාමයේ පිහිටා ඇති අම්බලම, පැරණි ළිඳ හා ඒ වටා උතුරින් මාර්ගය ද; නැගෙනහිරින් අඩි 10 ක් ද; දකුණින් මාර්ගය ද; බටහිරින් අඩි 5 ක් ද වශයෙන් සීමාවන භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 52′ 54″ N හා නැගෙනහිර දේශාංශ 79°58′ 59″ E).

17. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිවුලේගෙදර ග්‍රාම නිලධාරි වසමට අයත් කිවුලේගෙදර ග්‍රාමයේ පැරණි ගමවෙල කුඹුරුයායේ පිහිටි කිවුලේගෙදර මොහොට්ටාල පැරණි දේවාලය සහ එහි සිව් දිශාවෙන් මීටර් 5 ක් වශයෙන් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 7° 08′ 35″ N හා නැගෙනහිර දේශාංශ 80° 59′ 50″ E).

18. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹදෙණිය උතුර ග්‍රාම නිලධාරි වසමට අයත් දඹදෙණිය ග්‍රාමයේ වඩුවාකෙටුගල නමින් හඳුන්වන පුරාවිද්‍යාත්මක සාධකවලින් සමන්විත ගල්පර්වතය සහිත පහත සඳහන් භූගෝලීය ඛණ්ඩාංක මගින් වෙන් වූ භූමි පරිශ්‍රය ;

| *උතුරු අක්ෂාංශ* | *නැගෙනහිර දේශාංශ* |
|---|---|
| 7° 22′ 22.61″ N | 80° 8′ 52.83″ E |
| 7° 22′ 20.80″ N | 80° 8′ 56.05″ E |
| 7° 22′ 17.48″ N | 80° 8′ 57.36″ E |
| 7° 22′ 15.23″ N | 80° 8′ 55.39″ E |
| 7° 22′ 18.30″ N | 80° 8′ 50.48″ E |

19. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔරුගල ග්‍රාම නිලධාරි වසමට අයත් රාජංගනය ජලාශය ග්‍රාමයේ ඇති රාජංගනය ජලාශය වැව් බැම්ම හා පහළ ප්‍රදේශයේ පහත සඳහන් භූගෝලීය ඛණ්ඩාංක මගින් වෙන් කර දැක්වෙන භූමි පරිශ්‍රය හා ඒ තුළ ඇති පැරණි ස්ථූප ගොඩැල්ල, නටබුන් ගොඩනැගිලි සාධක, කටාරම් කෙටූ ලෙන් දෙක, ගලේ කෙටූ පියගැට පෙළ සහ පර්වතය මත පිහිටි පැරණි ස්ථූපය සහිත කාඩිගල පුරාවිද්‍යා ස්ථානය

| *උතුරු අක්ෂාංශ* | *නැගෙනහිර දේශාංශ* |
|---|---|
| 8° 8′ 29.46″ N | 80° 13′ 19.55″ E |
| 8° 8′ 24.04″ N | 80° 13′ 25.38″ E |
| 8° 8′ 18.51″ N | 80° 13′ 23.16″ E |
| 8° 8′ 22.35″ N | 80° 13′ 20.04″ E |
| 8° 8′ 22.08″ N | 80° 13′ 18.37″ E |
| 8° 8′ 27.38″ N | 80° 13′ 16.36″ E |

20. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දුටුගැමුණුපුර අංක 71 ග්‍රාම නිලධාරි වසමට අයත් ජනසවිගම ග්‍රාමයේ ගලපිටගල පුරාවිද්‍යා ස්ථානය නමින් හඳුන්වන ලෙන් සහිත ගල්පර්වතය සහ ඒ වටා සිව් දිශාවට මීටර් 30කි න් යුක්ත වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 34′ 97.7" N හා නැගෙනහිර දේශාංශ 81° 26′ 95.4"E)

EOG 09 - 0122

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.